0234

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
කළමනාකරණ අධ්‍යයන ගෞරව උපාධි පාඨමාලාව
4 වන මට්ටම: II වන සමාසිකය
**AFU4573 මූල්‍ය කළමනාකරණය**
අවසාන පරීක්ෂණය – 2024/2025
කාලය පැය තුනයි (03)

දිනය: 10.01.2026 වේලාව: ප.ව. 1.30 – 4.30

උපදෙස්:

- ඕනෑම ප්‍රශ්න පහ (05)කට පිළිතුරු සපයන්න.
- සියලු පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.
- සෑම පිළිතුරක්ම නව පිටුවකින් ආරම්භ කරන්න.
- ප්‍රශ්න ගණන 06 යි, පිටු ගණන 04 යි.
- වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර පමණක් භාවිතා කල හැක.

1. (අ) ව්‍යාපාර සංවිධානයක මූල්‍ය ශ්‍රිතයේ අරමුණ පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණයට අදාළ ප්‍රධාන තීරණ හතර (04) සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ඇ) “ලාභ උපරිම කිරීම යන මූලධර්මය මූල්‍ය තීරණ ගැනීමේදී ක්‍රියාත්මක කිරීමට උචිත නිර්ණායකයක් නොවේ” . ලාභ උපරිම කිරීම යන මූලධර්මය සම්බන්ධයෙන් ඇති ප්‍රධාන ගැටළු තුනක් (03) සාකච්ඡා කරමින් මෙම ප්‍රකාශනය සාධාරණීය කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

2. (අ) “මුදලේ කාල වටිනාකම (Time Value of Money)” යන සංකල්පය පැහැදිලි කර, යම්කිසි මුදලක් අනාගතයේදී ලබාගැනීමට වඩා වර්තමානයේදී ලබා ගැනීමට පුද්ගලයන් කැමති වීමට හේතු තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 06)

(ආ) වසර 9 කින් ඔබේ මුදල් තුන් ගුණයක් බවට පත් කිරීමේ හැකියාවක් ඇති තැන්පතු යෝජනාවක් ඔබට බැංකුවක් විසින් ලබා දී ඇත. මෙම යෝජනාක්‍රමයෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ අනුපාතය (Rate of Return) කීයද? (ලකුණු 04)

(ඇ) ඔබ රු. 500,000 ක ණයක් වාර්ෂිකව සංයුක්ත වන 8% ක පොලී අනුපාතයක් යටතේ වසර 8 ක් සඳහා ලබාගෙන ඇතැයි සිතන්න. මෙම තොරතුරු ඇසුරෙන්;

(i) වාර්ෂික ණය වාරිකය (Annual Loan Installment) සහ පළමු වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපූරණය (Capital Repayment) ගණනය කරන්න.

(ii) ණය කාලය තුළ ගෙවිය යුතු සමස්ත පොලී වියදම ගණනය කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

3. (අ) සමාගමක නිදහස් කළ හැකි වරණීය කොටස්වල ලක්ෂණ දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) ණයකර සමඟ සංසන්දනය කළ විට මූල්‍ය මූලාශ්‍රයක් ලෙස ස්කන්ධ ප්‍රාග්ධනයේ වාසි දෙකක් (02) සහ අවාසි දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ඇ) සුසන්ත පී.එල්.සි යනු කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගමකි. පසුගිය වර්ෂයේ මූල්‍ය කාර්යසාධනය වැඩිවීමත් සමඟ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාංශ ගෙවීමේ අනුපාතය 30% සිට 40% දක්වා වැඩි කර ඇත. පසුගිය වර්ෂ දෙක සඳහා පහත මූල්‍ය තොරතුරු ඔබට ලබා දී ඇත.

| මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා; | **2024** (රු.'000) | **2025** (රු.'000) |
|---|---|---|
| බදු පසු ලාභය | 14,800 | 15,200 |
| සාමාන්‍ය කොටස් ගණන | 5,000 | 5,000 |

සමාගම ලාභාංශ වාර්ෂිකව 5% ක අනුපාතයකින් අඛණ්ඩව වැඩි වනු ඇතැයි අපේක්ෂා කරන අතර එහි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන පිරිවැය වාර්ෂිකව 12% කි.

ඉහත තොරතුරු භාවිතයෙන්:

(i) ලාභාංශ වර්ධන ආකෘතිය (Dividend Growth Model) භාවිතා කරමින් සුසන්ත පී.එල්.සි සමාගමේ ස්කන්ධ කොටසක වටිනාකම ගණනය කරන්න.

(ii) ස්කන්ධ කොටස් අගය කිරීමට ලාභාංශ වර්ධන ආකෘතිය යොදාගැනීමෙහි දුර්වලතා දෙකක් (02) සාකච්ඡා කරන්න. **(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

4. (අ) අවදානම් - ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාවයේ ස්වභාවය ආයෝජන තීරණ ගැනීමේදී බලපාන ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

(ආ) විධිමත් (Systematic) සහ අවිධිමත් (Unsystematic) අවදානම් අතර වෙනස පැහැදිලි කර, මෙම අවදානම් කළමනාකරණය සඳහා ආයෝජනය කළඹක් (Portfolio) උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 04)**

(ඇ) ABC ඉන්වෙස්මන්ට් පී.එල්.සි යනු මධ්‍යම ප්‍රමාණයේ සමාගමක් වන අතර, එය සිය ගනුදෙනුකරුවන් සඳහා ආයෝජන කළඹ කළමනාකරණය කිරීමේ විශේෂඥත්වය දක්වයි. මෑතකදී, සමාගමේ ගනුදෙනුකරුවෙකු සඳහා ප්‍රශස්ත ආයෝජන කලඹක් තෝරා දීම සඳහා, සමාගම් කිහිපයක කොටස් වල අවදානම සහ ප්‍රතිලාභ ඇගයීමේ කාර්යභාරය එහි කළඹ කළමනාකරුවකුට ලබා දී ඇත. ගනුදෙනුකරු X, Y සහ Z යන සමාගම් තුනේ කොටස් වලට කැමත්ත දක්වයි. මෙම කොටස් තුන සම්බන්ධයෙන් පහත පුරෝකථන ලබා දී ඇත.

| ආර්ථික තත්ත්වය | සම්භාවිතාව | X සමාගමේ කොටස් | Y සමාගමේ කොටස් | Z සමාගමේ කොටස් |
|---|---|---|---|---|
| වර්ධන | 0.2 | 15% | 25% | 12% |
| සාමාන්‍ය | 0.3 | 10% | 11% | 10% |
| අවපාත | 0.5 | 7% | 4% | 6% |

ඉහත තොරතුරු භාවිතයෙන්:

(i) X, Y සහ Z සමාගම්වල කොටස් සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත (Expected Rates of Return) සහ ඒවායේ සම්මත අපගමන (Standard Deviations) ගණනය කරන්න.

(ii) ගනුදෙනුකරුගේ ආයෝජන කළඹ සඳහා වඩාත් සුදුසු කොටස් දෙක නම් කර, ඔබේ තේරීමට හේතු පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

**(මුළු ලකුණු 20)**

5. (අ) සමාගමක ප්‍රාග්ධන අයවැය තීරණ (Capital Budgeting Decisions) යන්නෙහි අර්ථය කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 03)**

(ආ) පිලිගෙවුම් කාලය (Payback Period) සහ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (Accounting Rate of Return) යන ක්‍රම සමග සංසන්දනය කරමින් ශුද්ධ වර්තමාන අගය (Net Present Value) ක්‍රමයේ වාසි තුනක් (03) පැහැදිලි කරන්න. **(ලකුණු 06)**

(ඇ) නව නිෂ්පාදනයක් සඳහා භාවිතා කළ හැකි නව යන්ත්‍රයක් මිලදී ගැනීමේ යෝජනාවක් ඇගයීමේ කාර්යභාරය ඔබට ලබා දී ඇත. යන්ත්‍රයේ පිරිවැය රු. 5,500,000 ක් වන අතර, එයට වර්ෂ පහක ඵලදායී ජීවකාලයක් ඇත. යන්ත්‍රයේ ජීවකාලය තුළ පහත මුදල් ප්‍රවාහයන් ජනනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(රු.'000)

| | 1 වර්ෂය | 2 වර්ෂය | 3 වර්ෂය | 4 වර්ෂය | 5 වර්ෂය |
|---|---|---|---|---|---|
| නිෂ්පාදනයේ විකුණුම් මගින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය | 1,200 | 2,400 | 2,700 | 2,000 | 1,100 |
| යන්ත්‍රයේ සුන්බුන් අගය | | | | | 500 |

සමාගම මෙම වර්ගයේ ව්‍යාපෘති ඇගයීමට 10% ක ප්‍රාග්ධන පිරිවැය අනුපාතයක් භාවිතා කරයි.

ඉහත තොරතුරු භාවිතයෙන්:

(i) නව යන්ත්‍රය මිලදී ගැනීමේ යෝජනාව සඳහා පිලිගෙවුම් කාලය, ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය සහ ශුද්ධ වර්තමාන අගය ගණනය කරන්න.

(ii) ඉහත (i) කොටසෙහි ගණනය කිරීම මත පදනම්ව මෙම යෝජනාවේ මූල්‍ය ශක්‍යතාවය සාකච්ඡා කරන්න. **(ලකුණු 11)**

**(මුළු ලකුණු 20)**

6. (අ) සමාගමක් සිය ලාභාංශ ප්‍රතිපත්තිය තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක තුනක් (03) පැහැදිලි කරන්න **(ලකුණු 06)**

(ආ) Trade-off Theory යොදා ගෙන ප්‍රාග්ධන ව්‍යුහය (Capital Structure) සහ සමාගමේ අගය (firm value) අතර ඇති සම්බන්ධය සාකච්ඡා කරන්න. **(ලකුණු 06)**

(ඇ) වෙළඳපොළ පොලී අනුපාත, බදු ප්‍රතිපත්ති සහ ආයෝජකයන්ගේ අපේක්ෂාවන් වෙනස් වීම් සමාගමක ප්‍රාග්ධන පිරිවැය මත බලපාන ආකාරය සාකච්ඡා කරන්න. ඔබේ පැහැදිලි කිරීම සඳහා උදාහරණ ලබා දෙන්න. **(ලකුණු 08)**

**(මුළු ලකුණු 20)**

*----- සියලු හිමිකම් ඇවිරිණි -----*

# PRESENT VALUE TABLE

**Present value of $1, that is $(1+r)^{-n}$ where $r$ = interest rate; $n$ = number of periods until payment or receipt.**

| Periods ($n$) | Interest rates ($r$) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1% | 2% | 3% | 4% | 5% | 6% | 7% | 8% | 9% | 10% |
| 1 | 0.990 | 0.980 | 0.971 | 0.962 | 0.952 | 0.943 | 0.935 | 0.926 | 0.917 | 0.909 |
| 2 | 0.980 | 0.961 | 0.943 | 0.925 | 0.907 | 0.890 | 0.873 | 0.857 | 0.842 | 0.826 |
| 3 | 0.971 | 0.942 | 0.915 | 0.889 | 0.864 | 0.840 | 0.816 | 0.794 | 0.772 | 0.751 |
| 4 | 0.961 | 0.924 | 0.888 | 0.855 | 0.823 | 0.792 | 0.763 | 0.735 | 0.708 | 0.683 |
| 5 | 0.951 | 0.906 | 0.863 | 0.822 | 0.784 | 0.747 | 0.713 | 0.681 | 0.650 | 0.621 |
| 6 | 0.942 | 0.888 | 0.837 | 0.790 | 0.746 | 0705 | 0.666 | 0.630 | 0.596 | 0.564 |
| 7 | 0.933 | 0.871 | 0.813 | 0.760 | 0.711 | 0.665 | 0.623 | 0.583 | 0.547 | 0.513 |
| 8 | 0.923 | 0.853 | 0.789 | 0.731 | 0.677 | 0.627 | 0.582 | 0.540 | 0.502 | 0.467 |
| 9 | 0.914 | 0.837 | 0.766 | 0.703 | 0.645 | 0.592 | 0.544 | 0.500 | 0.460 | 0.424 |
| 10 | 0.905 | 0.820 | 0.744 | 0.676 | 0.614 | 0.558 | 0.508 | 0.463 | 0.422 | 0.386 |
| 11 | 0.896 | 0.804 | 0.722 | 0.650 | 0.585 | 0.527 | 0.475 | 0.429 | 0.388 | 0.350 |
| 12 | 0.887 | 0.788 | 0.701 | 0.625 | 0.557 | 0.497 | 0.444 | 0.397 | 0.356 | 0.319 |
| 13 | 0.879 | 0.773 | 0.681 | 0.601 | 0.530 | 0.469 | 0.415 | 0.368 | 0.326 | 0.290 |
| 14 | 0.870 | 0.758 | 0.661 | 0.577 | 0.505 | 0.442 | 0.388 | 0.340 | 0.299 | 0.263 |
| 15 | 0.861 | 0.743 | 0.642 | 0.555 | 0.481 | 0.417 | 0.362 | 0.315 | 0.275 | 0.239 |
| 16 | 0.853 | 0.728 | 0.623 | 0.534 | 0.458 | 0.394 | 0.339 | 0.292 | 0.252 | 0.218 |
| 17 | 0.844 | 0.714 | 0.605 | 0.513 | 0.436 | 0.371 | 0.317 | 0.270 | 0.231 | 0.198 |
| 18 | 0.836 | 0.700 | 0.587 | 0.494 | 0.416 | 0.350 | 0.296 | 0.250 | 0.212 | 0.180 |
| 19 | 0.828 | 0.686 | 0.570 | 0.475 | 0.396 | 0.331 | 0.277 | 0.232 | 0.194 | 0.164 |
| 20 | 0.820 | 0.673 | 0.554 | 0.456 | 0.377 | 0.312 | 0.258 | 0.215 | 0.178 | 0.149 |

CUMULATIVE PRESENT VALUE TABLE

| Periods ($n$) | Interest rates ($r$) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1% | 2% | 3% | 4% | 5% | 6% | 7% | 8% | 9% | 10% |
| 1 | 0.990 | 0.980 | 0.971 | 0.962 | 0.952 | 0.943 | 0.935 | 0.926 | 0.917 | 0.909 |
| 2 | 1.970 | 1.942 | 1.913 | 1.886 | 1.859 | 1.833 | 1.808 | 1.783 | 1.759 | 1.736 |
| 3 | 2.941 | 2.884 | 2.829 | 2.775 | 2.723 | 2.673 | 2.624 | 2.577 | 2.531 | 2.487 |
| 4 | 3.902 | 3.808 | 3.717 | 3.630 | 3.546 | 3.465 | 3.387 | 3.312 | 3.240 | 3.170 |
| 5 | 4.853 | 4.713 | 4.580 | 4.452 | 4.329 | 4.212 | 4.100 | 3.993 | 3.890 | 3.791 |
| 6 | 5.795 | 5.601 | 5.417 | 5.242 | 5.076 | 4.917 | 4.767 | 4.623 | 4.486 | 4.355 |
| 7 | 6.728 | 6.472 | 6.230 | 6.002 | 5.786 | 5.582 | 5.389 | 5.206 | 5.033 | 4.868 |
| 8 | 7.652 | 7.325 | 7.020 | 6.733 | 6.463 | 6.210 | 5.971 | 5.747 | 5.535 | 5.335 |
| 9 | 8.566 | 8.162 | 7.786 | 7.435 | 7.108 | 6.802 | 6.515 | 6.247 | 5.995 | 5.759 |
| 10 | 9.471 | 8.983 | 8.530 | 8.111 | 7.722 | 7.360 | 7.024 | 6.710 | 6.418 | 6.145 |
| 11 | 10.368 | 9.787 | 9.253 | 8.760 | 8.306 | 7.887 | 7.499 | 7.139 | 6.805 | 6.495 |
| 12 | 11.255 | 10.575 | 9.954 | 9.385 | 8.863 | 8.384 | 7.943 | 7.536 | 7.161 | 6.814 |
| 13 | 12.134 | 11.348 | 10.635 | 9.986 | 9.394 | 8.853 | 8.358 | 7.904 | 7.487 | 7.103 |
| 14 | 13.004 | 12.106 | 11.296 | 10.563 | 9.899 | 9.295 | 8.745 | 8.244 | 7.786 | 7.367 |
| 15 | 13.865 | 12.849 | 11.938 | 11.118 | 10.380 | 9.712 | 9.108 | 8.559 | 8.061 | 7.606 |
| 16 | 14.718 | 13.578 | 12.561 | 11.652 | 10.838 | 10.106 | 9.447 | 8.851 | 8.313 | 7.824 |
| 17 | 15.562 | 14.292 | 13.166 | 12.166 | 11.274 | 10.477 | 9.763 | 9.122 | 8.544 | 8.022 |
| 18 | 16.398 | 14.992 | 13.754 | 12.659 | 11.690 | 10.828 | 10.059 | 9.372 | 8.756 | 8.201 |
| 19 | 17.226 | 15.679 | 14.324 | 13.134 | 12.085 | 11.158 | 10.336 | 9.604 | 8.950 | 8.365 |
| 20 | 18.046 | 16.351 | 14.878 | 13.590 | 12.462 | 11.470 | 10.594 | 9.818 | 9.129 | 8.514 |